## ශ්‍රී ලංකා යාපනය විශ්ව විද්‍යාලයේ 2012

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය ව්‍යාචනය**

මෙම වාර්තාවේ 1.2.3 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

විගණනයේදී පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල 2005, 2006, 2007, 2008 හා 2009 වර්ෂවලට අදාළව දැක්වෙන රු.1,359,072 ක් වටිනාකම වූ සඟරා හා වාර සඟරා විෂයයන් 87 ක් සහ රු.2,191,072 ක් වටිනාකම වූ පොත් හා වාර සඟරා 2013 ජූනි 30 දක්වා සැපයුම්කරුවන්ගෙන් ලැබී නොතිබුණි. කෙසේ වුවද එම පොත් හා වාර සඟරා වෙනුවෙන් රු.438,214 ක් වූ ක්ෂය ආදායමට එරෙහිව අයකර තිබුණි.

(ආ) ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් රු.1,708,750 ක් වූ ගොඩනැගිලි වැඩ නිමකර විශ්ව විද්‍යාලයට භාරදී තිබුණි. කෙසේ වුවද, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් වැඩ නිම කිරීමේ සහතිකය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එය ප්‍රාග්ධනීත කර නොතිබුණි.

(ඇ) රු.1,202,957,271 ක් වූ ආදායමට වැඩි වියදම සමුච්චිත අරමුදලට අයකරනු වෙනුවට පොදු සංචිතයට සාවද්‍යව හර කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2012 දෙසැම්බර් 31 දිනට පොදු සංචිතයෙහි හර ශේෂයක් දක්වා තිබුණි.

(ඇ) විශ්ව විද්‍යාලයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් කිහිප දෙනෙකුගෙන් ලැබිය යුතු වූ නිවාස කුලී රු.55,050 කින් , සමාලෝචිත වර්ෂය තුළදී රු.27,250 ක මුදලක් කාර්ය මණ්ඩලයෙන් අය කරගෙන නොතිබුණි.

(ඉ) රු.3,791,274 ක් වූ පොලිය පරිත්‍යාග අරමුදලින් ලැබිය යුතු ලෙස හෙළිදරව් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ ආයෝජන ආදායම් ගිණුමට අයකරනු වෙනුවට එම මුදල සීමාකාරී අරමුදල් ගිණුමට බැර කර තිබුණි.

(ඊ) 2012 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුම ලෙස රු.364,569 ක මුදලක් දක්වා තිබුණු අතර, මෙයින් රු.103,410 ක මුදලක් වර්ෂ 6 කට වැඩි කාලයක් නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව පැවතුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළ වැටුප් අත්තිකාරම් ගිණුමේ හා ආනයන අත්තිකාරම් ගිණුමේ එකතුව රු.993,456 ක් වූ නිවැරදි කිරීම් කිහිපයක් විධිමත් ජර්නල් සටහන් නොමැතිව සිදුකර තිබුණි.

(ඌ) 2012 දෙසැම්බර් මාසයේදී පුස්තකාල පොත් හා වාර සඟරා මිලදී ගැනීම හේතුවෙන් එකතුව රු.705,500 ක් වූ ගෙවීම් වවුචර් 06 ක් වංචාකාරීව සකස් කර තිබුණද මෙම වංචනික ගනුදෙනුව සඳහා වහාම පියවර ගෙන නොතිබුණු අතර එය පොත් හා වාර සඟරා ගිණුමට සාවද්‍යාව හර කර තිබුණි.

**2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-----------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ රු.504,237 ක හිඟ ශේෂයන්ට අදාළව මූල්‍ය ප්‍රකාශනවල අඩමාන ණය සඳහා ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

(ආ) වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ රු.2,562,402 ක ශේෂ ගෙවිය යුතු වෙළඳ ශේෂ තුළ ඇතුළත්ව තිබුණි.

(ඇ) රු.1,080,499 ක් වූ විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලයට නොගෙවන ලද වැටුප් , මුදල් රෙගුලාසි 272 (2) හා 290 ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 01 සිට 02 දක්වා කාලයක් ගෙවිය යුතු ශේෂ ලෙස පැවතුණි.

(ඈ) ගොඩනැගිලි දෙපාර්තමේන්තුව , ලංකා විදුලි බල මණ්ඩලය, විශ්ව විද්‍යාලයේ කාර්ය මණ්ඩලය හා පොත් හා වාර සඟරා ආනයනය කිරීම සඳහා සැපයුම්කරුවන් වැනි විවිධ පාර්ශවයන්ට ගෙවන ලද අත්තිකාරම් හා වැටුප් අත්තිකාරම් එකතුව රු.311,866,788 ක් 2013 ජූනි 30 දක්වා අයකර ගෙන නොතිබුණි. මෙයින් රු.3,810,882 ක මුදලක් වර්ෂ 10 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඉ) නිලධාරියකුගෙන් ලැබිය යුතු රු.53,055 ක් වූ ආපදා ණය ශේෂය හා වෙනත් නිලධාරියකුගෙන් ලැබිය යුතු රු.10,802 ක් වූ යතුරු පැදි ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව පිළිවෙලින් පසුගිය වර්ෂ 9 ක් හා වර්ෂ 11 ක් හිඟ හිට පැවතුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු එකතුව රු.1,160,054,959 ක් වූ දේපල, පිරියත හා උපකරණ වටිනාකම පොත් අගය මත පදනම්ව තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළදී මෙම වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. තවද ස්ථාවර වත්කම් පිළිබඳ විස්තරාත්මක උපලේඛනයක් සහ ස්ථාවර වත්කම්වලට අදාළ ලේඛනයක් විධිමත්ව පවත්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්වල පැවැත්ම, නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය පිළිබඳ විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(ආ) වාර්ෂික සමීක්ෂණ වාර්තා, ඉදිරි වැඩ සටහන් හා අධිකාරිය, දුරකථන ලේඛනය , වාහන පරීක්ෂකගේ වාර්තා හා වාහන ලොග් පොත් වැනි සාක්ෂි හෝ උපයෝගී සාක්ෂි නොමැතිවීම හේතුවෙන් ඉන්වෙන්ට්‍රි විෂයයන් , ගමන් වියදම්, දීමනා , කුලී ගෙවීම්, විදුලි සංදේශ ගාස්තු, වාහන අළුත්වැඩියා සහ පිරිසිදු කිරීමේ සේවාවට ගෙවීම් වැනි ගිණුම්වල දැක්වෙන එකතුව රු.36,402,416 ක් වූ විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

(ඇ) පහත දැක්වෙන සාක්ෂි හෝ උපයෝගී සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පරිත්‍යාග, වාහන අනතුරු පිළිබඳව දරන ලද පාඩු හා හානි , පර්යේෂණ දීමනා, අධ්‍යයන වැඩසටහන් සඳහා ගෙවීම් ආදී විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

- විදේශ රටවල්වලින් / තානාපති කාර්යාලවලින් ලැබුණු පරිත්‍යාග පිළිබඳ විස්තරාත්මක වාර්තා
- විශ්ව විද්‍යාල සනාථන සභා රැස්වීම්වල සටහන්
- අනතුරු හා පාඩු පිළිබඳ වාර්තා
- කළමනාකරණ අධ්‍යයන පීඨයේ අධ්‍යයන වැඩසටහන් පිළිබඳ විස්තර
- අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ පිළිබඳ විස්තර

## 2.2.4 **නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති ,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය .

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහය | |
| (i) XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | විශ්ව විද්‍යාලයේ හා වවුනියා මණ්ඩපයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ii) XXII පරිච්ඡේදයේ 18.1 වගන්තිය | මාණ්ඩලික සහායක නිලධාරියකු වැඩ තහනමකට ලක් කළ හැක්කේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාට හෝ විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාට පමණක් වුවද එයට පටහැනිව විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී විසින් එම නිලධාරියාගේ වැඩ |

| | | |
|---|---|---|
| | | තහනම් කර තිබුණි. |
| (iii) | XXII පරිච්ඡේදයේ 11.1 වගන්තිය | වංචනික ගනුදෙනුවක් සම්බන්ධයෙන් විමර්ශන කමිටුව පත්කර මාසයක් ගතවීමෙන් පසුවද , විනය ක්‍රියාමාර්ග කටයුතු ආරම්භ කර නොතිබුණි. |
| (iv) | XXVI පරිච්ඡේදයේ 2,3,4 වගන්ති | ප්‍රකාශන හා පුස්තකාල පොත් තොගය වාර්ෂිකව සමීක්ෂණය කර නොතිබුණි. |

**(ආ) මුදල් රෙගුලාසි**

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 135 (4) | ගණන් දීමේ නිලධාරී විසින් වාර්ෂිකව මූලා බලතල පැවරීම ප්‍රතිශෝධනය කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මුදල්රෙගුලාසි 136 (6) | අධිකාරි බලය ලත් නිලධාරියාගේ වාර්තා සහතික කරන නිලධාරිගේ වාර්තා සමග අවම වශයෙන් මාසයකට එක් වරක් හෝ සසඳා ප්‍රතිසංසන්දනය කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 140 (3) | ගෙවීම කිරීමට පෙර වගකිව යුතු නිලධාරියා විසින් ඔහු / ඇය සතු විශේෂ දැනුම මත කරුණු සොයා බැලිය යුතුය. කෙසේ වුවද අවස්ථා හයකදී වංචනික ගෙවීම් වවුචර් මගින් රු.705,500 ක මුදලක් ගෙවා තිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 272 (3) | ගෙවීම් වවුචර්, ඒවා අයත් වන මාසය අවසන් වී සති 6 ක් ඉක්මයාමට පෙර මාසිකව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 1645 | වාහනය භාර නිලධාරියා විසින් සෑම මාසයකම |

| | | |
|---|---|---|
| | | එක් එක් වාහනයේ ගමන් පිළිබඳ මාසික සාරාංශ හා දෛනික ධාවන සටහන් වාර්තා ඊළග මාසයේ 15 දිනට පෙර උප කුලපති මගින් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 1980 පෙබරවාරි 25 දිනැති අංක 63 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | අයවැයගත ආදායම හා වියදම සහ තථ්‍ය ආදායම හා වියදම අතර වෙනස්වීම හා එම විචලනයන් සඳහා හේතු දැක්වෙන වාර්තාවක් සමාලෝචිත වර්ෂයේ අවසාන ගිණුම් සමග ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහනවල ඉන්ධන පරිභෝජනය අවම වශයෙන් මාස 6 කට වරක් පරීක්ෂා කළ යුතුය. එහෙත් මෙම ක්‍රියා පිළිවෙල අනුගමනය කර නොතිබුණි. |
| (ඉ) | අංක 150 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ආදේශ කිරීමේ පදනම මත වාහනයක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දීමේදී නව වාහනය ලියාපදිංචි කිරීමේ දින සිට මාස දෙකක් ඇතුළත පැරණි වාහනය අපහරණය කළ යුතුය. එම වාහනය විකිණීමෙන් ලත් මුදල් දින 14 ක් ඉකුත් වීමට පෙර හැකි ඉක්මණින් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. කෙසේ වුවද වර්ෂය තුළ මිලදී ගත් වාහනය සම්බන්ධයෙන් මෙම පරිපාටිය අනුගමනය කර නොතිබුණි. |

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය සමාලෝචනය

#### 3.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.100,783,982 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.60,290,341 ක් විය. ඒ අනුව පුද්ගලික පඩිනඩි , ගිවිසුම්ගත සේවා, ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් හේතුවෙන් විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලවල රු.40,493,641 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි.

#### 3.1.2 ආර්ථික නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්යාල දුරකථන ගාස්තු අඩුකිරීමේ අරමුණින් පවත්නා සෘජු දුරකථන භාවිතය අඩුකිරීම මගින් 2011 ජනවාරි මාසයේදී විශ්ව විද්‍යාලයේ දුරකථන ඉන්ටර්කොම් පහසුකම් ස්ථාපිත කර තිබුණි. කෙසේ වුවද ඉකුත් වර්ෂයේ දුරකථන ගාස්තු සමග සැසදීමේදී සමාලෝචිත වර්ෂය සඳහා දුරකථන ගාස්තු රු.2,635,377 කින් එනම් සියයට 20 කින් වැඩි වී තිබුණු අතර සමානව ලබා ගන්නා ඇමතුම් පහසුකම් ඉන්ටර් කොම් පහසුකම් මගින් ලබා ගැනීම මෙයට හේතු වී තිබුණි.

(ආ) විශ්ව විද්‍යාලයේ අමුත්තන්ගේ නිවාසයක විශ්ව විද්‍යාල ලේඛකාධිකාරීවරයා හා නියෝජ්‍ය ලේඛකාධිකාරීවරයා (ප්‍රාග්ධන වැඩ ) විසින් පිළිවෙලින් 2009 අප්‍රේල් මස සිට හා 2010 නොවැම්බර් මස සිට කුලී ගෙවීමකින් තොරව භාවිතා කර තිබුණි. මේ සම්බන්ධයෙන් වූ විදුලි ගාස්තු එකතුව රු.37,262 ක් විශ්ව විද්‍යාල අරමුදල් වලින් ගෙවා තිබුණි.

(ඇ) රු.242,263,073 ක් හා රු.132,618,288 ක් වූ මුදල් ආයෝජනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පිළිවෙලින් දිගුකාලීන හා කෙටිකාලීන ආයෝජන ලෙස දක්වා තිබුණි. කෙසේවුවද මුළු ආයෝජනවලින් සියයට 0.001 ක් වූ

රු.4,497 ක මුදලක් පමණක් ආයෝජනවලින් ලද ආදායම ලෙස ගිණුම්වල දක්වා තිබුණි. ඒ අනුව විශ්ව විද්‍යාල අරමුදල් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කර නොතිබුණි.

### 3.1.3 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පහත දැක්වෙන වාහන නිෂ්කාර්යව පැවතුණි. කෙසේ වුවද මෙම වාහන විශ්ව විද්‍යාලයේ අරමුණුගත කාර්යයන් සඳහා යොදා ගැනීමට අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

| | |
|---|---|
| ලැන්ඩ් මාස්ටර් | 01 |
| ස්කූටර් | 01 |
| ත්‍රීරෝද රථ | 01 |
| | --- |
| | 03 |

(ii) එකතුව රු.4,107,424 ක් වූ සැපයුම් හා නඩත්තු විෂයන් වර්ෂ 01 සිට 14 දක්වා කාලයක් භාවිතා නොකර විශ්ව විද්‍යාලයේ ගබඩාවල පැවතුණි. ඒවා උපයෝජනය කිරීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(iii) රු.182,400 කට මිලදීගත් වේලා සටහන් යන්ත්‍රයක් 2001 වර්ෂයේ සිට භාවිතා නොකර පැවතුණි.

(iv) රු.1,482,000 කට මිලදී ගත් යකඩ ඇඳන් 156 ක් වර්ෂ හයකට වැඩි කාලයක් භාවිතා නොකර පැවතුණි.

(v) කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ පීඨාධිපති කාර්යාලයේ, මානව සම්පත් දෙපාර්තමේන්තුවේ, ගිණුම් දෙපාර්තමේන්තුවේ හා භෞතික විද්‍යා දෙපාර්තමේන්තුවේ පරිගණක හා උපාංග , මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් උපකරණ හා ලී බඩු 161 ක සංඛ්‍යාවක් නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම් ලෙස හඳුනා ගෙන තිබුණි.

(vi) විශ්ව විද්‍යාලයේ LAN /WAN සම්බන්ධතාවයන් එකලස් කිරීම සඳහා පුද්ගලික ගනුදෙනුකරුවන් දෙදෙනෙකු විසින් ගෙන එන ලද සීඩා (SIDA) ව්‍යාපෘතිය යටතේ ලැබුණු විෂයයන් 970 ක් පරිගණක විද්‍යා දෙපාර්තමේන්තුවේ වර්ෂ දෙකකට වැඩි කාලයක් නිෂ්කාර්යව තිබෙන්නට ඉඩ හැර තිබුණි.

(vii) හානි වූ විෂයයන් 223 ක් පරිගණක විද්‍යා දෙපාරතමේන්තුවේ වර්ෂ එකකට වැඩි කාලයක් නිෂ්කාර්යව තිබුණු බව නිරීක්ෂණය වූ අතර ඒ පිළිබඳව මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(viii) ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව 2008,2009,2010 හා 2012 වර්ෂවලදී ක්‍රීඩා විද්‍යාගාර ඒකකයේ සම්බන්ධීකාරක විසින් ක්‍රීඩා උපකරණ 37 ක් අපහරණය කර තිබුණි.

**3.1.4 මතභේදයට තුඩුදෙන විෂයයන්**

**---------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගොඩනැගිලි, සම්පත් දායකයන් හා වෙනත් සියළුම පහසුකම් විශ්ව විද්‍යාලය වෙත තිබුණද , නීති පීඨයේ 4 වන වසරේ සිසුන් සඳහා දේශන 2008 මාර්තු සිට කොළඹ පිහිටි කුලී පදනම මත ලබා ගත් ගොඩනැගිල්ලක පවත්වා තිබුණු අතර ඒ සඳහා කුලී ලෙස මාසයකට රු.100,000 ක් බැගින් 2012 දෙසැම්බර් 31 දක්වා රු.5,430,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ii) 2011 මුල් භාගයේදී ඇඟිලි සලකුණු ස්කෑනරයක් සවි කිරීමට සැලසුම්කර තිබුණද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2010 පෙබරවාරි 15 දිනැති අංක 02/2010 දරන ආයතන චක්‍රලේඛය ප්‍රකාරව අදහස් කළ කාරණය සඳහා ඵලදායීව සවිකර නොතිබුණි.

(iii) 2012 ඔක්තෝබර් 15 දින රු.8,593,446 ක වටිනාකම වූ චෙක්පත් 22 ක් ලියා උපකරණ මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ලෙස ආයතන 14 ක් වෙත නිකුත් කර පසුව 2013 පෙබරවාරි 12 දින එම චෙක්පත් අවලංගු කර තිබුණි.

**3.2 මෙහෙයුම් සමාලෝචනය**

**3.2.1 ස්පෘශ්‍ය වත්කම්වල භෞතික පැවැත්ම පිළිබඳ සමීක්ෂණය**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XXVI පරිච්ඡේදයේ 2.4 හා 5 වගන්ති සහ XXIV පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව 2012 වර්ෂය සඳහා ස්ථාවර වත්කම් හා වෙනත් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පිළිබඳ වාර්ෂික භෞතික සමීක්ෂණය සිදුකර එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.2.2 විභාග හා ප්‍රතිඵල**

විශ්ව විද්‍යාලයේ එක් එක් පීඨ යටතේ පවත්වන ලද විවිධ පාඨමාලා සඳහා විභාග පැවැත්වීමේ දිනයන් හා එම විභාග සඳහා වූ ප්‍රතිඵල නිකුත් කිරීමේ ඉලක්ක දිනයන් තීරණය කර නොතිබුණි. තවද 2011 හා 2012 වර්ෂ තුළ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම, කලා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ සහ විද්‍යා පීඨවල හා බාහිර විභාග ඒකකය විසින් පවත්වන ලද විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් තිබූ බව නිරීක්ෂණය විය. 1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව විභාගය පැවැත්වීමෙන් පසු මාස තුනක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතුය. එහෙත් ප්‍රතිඵල මාස 4 සිට මාස 14 ක කාලයක් ප්‍රමාද කර තිබීම හේතුවෙන් ශිෂ්‍යයින්ගේ රැකියා අවස්ථාවන් කාලීනව ලබා ගැනීම ඔවුන්ට අහිමි කර තිබුණි.

**3.2.3 ඒක ශිෂ්‍ය පිරිවැය**

විශ්ව විද්‍යාලයේ පාඨමාලා සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 5896 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ දරන ලද මුළු පුනරාවර්තන වියදම රු.644,212,414 ක් විය. ඒ අනුව වර්ෂය සඳහා ඒක ශිෂ්‍ය සාමාන්‍ය පුනරාවර්තන පිරිවැය රු.109,263 ක් විය.

**3.2.4 මානව සම්පත් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) දැනට පුරප්පාඩුව පවතින කාර්ය මණ්ඩලය අඩු කිරීමට කටයුතු කිරීම වෙනුවට තාවකාලික පදනම මත වැඩිපුර කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි. විස්තර පහත පරිදි වේ.

| වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | පවත්නා සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 456 | 338 | 118 | - |
| අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | 56 | 30 | 26 | - |
| තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය | 126 | 168 | 04 | 46 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 726 | 531 | 195 | - |
| | 1,364 | 1,067 | 343 | 46 |

(ආ) අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පැමිණීමේ ලේඛනය දීර්ඝ කාලයක් සඳහා පවත්වා නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය මණ්ඩලය නිවාඩු, වැටුප් ගෙවීම පිළිබඳ නිරවද්‍යතාවය සමාලෝචිත වර්ෂය සඳහා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**3.2.5 බඳවා ගැනීම් සහ පත්කිරීම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 20 :16 ඡේදයෙහි විධිවිධාන හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් ඉදිරිපත් කරන ලද 2012 සැප්තැම්බර් 28 දිනැති අංක යූජීසී/එච්ආර්/3/1/6 දරන ලිපිය සැලකිල්ලට ගැනීමෙන් තොරව විශ්ව විද්‍යාල පාලක

සභාව සානුකම්පිත පදනම මත විවිධ පාර්ශ්වයන්ගේ අභියාචනා සැලකිල්ලට ගනිමින් සේවකයන් යළි සේවයට ගැනීමේ තීරණයක් ඉදිරිපත් කිරීමට තීරණය කර තිබුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් , සහකාර ලේඛකාධිකාරීවරුන් හා සමාන තනතුරුවල සේවය ස්ථිර කිරීමේ අධිකාරිය උසස් අධ්‍යාපන ආයතනවලට තිබෙන බවට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම් විසින් 2004 දෙසැම්බර් 10 දිනැති ඔහුගේ අංක යූජීසී /එච්ආර්1 දරන ලිපියෙන් යාපනය විශ්ව විද්‍යාලයේ උපකුලපති වෙත දන්වා තිබුණි.

කෙසේ වුවද කාර්ය මණ්ඩලයේ සේවය ස්ථිර කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාචික පරීක්ෂණය සඳහා පරීක්ෂක මණ්ඩලවලට ඒකාකාරී නොවන පරිදි විවිධ සාමාජිකයන් සංඛ්‍යාව පත්කර තිබුණි.

(ii) පත්වීමේ ලිපිවල 06 ඡේදයේ අවශ්‍ය පරිදි අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය පරීක්ෂා කිරීමට පරීක්ෂණ මණ්ඩලය සඳහා සාමාජිකයන් පත්කිරීමේ / තෝරාගැනීමේ විධිමත් ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි.

### 3.2.6 භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන අත්පොතේ 4.2.1 මාර්ගෝපදේශය අනුව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) වගන්තිය අනුව අවම වශයෙන් වර්ෂ 3 ක කාල පරිච්ඡේදයක් සඳහා අපේක්ෂා කරන ලද ප්‍රසම්පාදන කාර්යයන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ ලැයිස්තුගත කළ යුතු වුවත් විශ්ව විද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන කාර්යයන් ලැයිස්තුගත කර තිබුණි.

(ඇ) ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් කරන ලද අංක 07 සිට 13 දක්වා විෂයයන් සඳහා නිමකිරීමේ ඉලක්ක දිනයන් දක්වා නොතිබුණි.

(ඈ) ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කර නොතිබුණි.

(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.2 මාර්ගෝපදේශයට අනුව කාල ක්‍රමානුගත පිළිවෙළකට ආරම්භක ස්ථානයේ සිට එහි නිම වීම දක්වා එක් එක් ප්‍රසම්පාදන කාර්යය පිළිබඳ අදියර දැක්වෙන විස්තරාත්මක ප්‍රසම්පාදන කාල උපලේඛනයක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද, කාල උපලේඛනය හා එක් එක් ප්‍රසම්පාදන සැලැස්ම පිළිබඳ අදියර විශ්ව විද්‍යාලය විසින් පිළියෙල කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

2012 සිට 2016 කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කර තිබුණද 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව එය යාවත්කාලීනව සමාලෝචනය කර නොතිබුණි.

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

ක්‍රියාකාරී සැලැස්ම 2012 වර්ෂය සඳහා පිළියෙල කරනු වෙනුවට 2012 සිට 2016 වර්ෂ සඳහා පිළියෙල කර තිබුණි. කෙසේ වුවද ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබුණු ඉලක්ක පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සඳහා විගණන වැඩ සටහන ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකය මගින් පහත දැක්වෙන ගනුදෙනු ක්ෂේත්‍රයන් පරීක්ෂා කර ආවරණය කර නොතිබුණි.

(අ) ප්‍රාග්ධන ව්‍යාපෘති හා කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ පසු විගණනය

(ආ) විශ්ව විද්‍යාලයේ ප්‍රසම්පාදන කාර්යයන්

(ඇ) ණයගැති හා ණයහිමි කළමනාකරණය

(ඈ) ණය සහ අත්තිකාරම්

**4.4 විගණන විමසුම් පිළිබඳ පසු විපරම් කටයුතු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමහර විගණන විමසුම් අස්ථානගත වීම සහ සැලකිය යුතු කාලයකට පසුව නැවතත් පිටපත් ඉල්ලීම සිදුවී තිබුණු අතර ඒ හේතුවෙන් එක් එක් මුදල් වර්ෂවල විගණන විමසුම් විස්තර හා නිකුත් කරන ලද විගණන විමසුම් සංඛ්‍යාව පිළිබඳව විශ්ව විද්‍යාල කළමනාකරණය දැනුවත් වී නොතිබුණි.

(ආ) විගණන විමසුම්වල පිටපත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවටද ඉදිරිපත් කරන ලද නමුත්, එම විගණන විමසුම්වලට පිළිතුරු පිටපත් විශ්ව විද්‍යාලයේ උපකුලපති විසින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) පිළිතුරු නොසපයන ලද විගණන විමසුම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | පිළිතුරු නොසැපයූ විගණන විමසුම් සංඛ්‍යාව | ප්‍රමාද කාලය (මාස ) |
|---|---|---|
| 2011 | 01 | 16 |
| 2012 | 04 | 02 - 09 |

**4.5 වාර්ෂික වාර්තාව සභාගත කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2011 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව 2013 ඔක්තෝබර් 20 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**4.6 අයවැය ලේඛනමය පාලනය**

අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 4.7 පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) පුස්තකාල පරිපාලනය

(ඇ) ගබඩා පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) ව්‍යාපෘති ප්‍රමාදය

(ඊ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

(උ) ප්‍රසම්පාදන

(ඌ) මානව සම්පත් කළමනාකරණය

(එ) අයවැය